“ සියළු හිමිකම් ඇවිරිණි ”

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2020
පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර මාලාව

 © All Right Received www.learntv.lk 

**01.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

ඇඳුම් මැසීමේ පාඨමාලාවක් සාර්ථකව නිම කළ ශෙහානි හා දුලක්ෂි 2019-01- 01 දින රු. 50,000 බැගින් ප්‍රාග්ධනය යොදවමින් නීරෝගා මුඛ ආවරණ නිපැයුම් නමින් සෞඛ්‍යය ආරක්ෂිත ඉහළ ප්‍රමිතියෙන් හා ගුණාත්වයෙන් යුතු මුඛ ආවරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ජනාකීර්ණ පරිසරයක කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. මෙම නිෂ්පාදිත ජංගම රථ මගින් අලෙවි කිරීමට එකගතාවයක් ඇතිවිය. අලෙවියෙන් ලැබෙන මුදල් බැංකු ගත කර චෙක් පත් මගින් ගණුදෙනු කිරීමට ගිවිස ගත්හ මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීමට රු300 000 ක බැංකු ණය මුදලක් 2019-01-01 දින 10% ක වාර්ෂික පොලියට ලබා ගන්නා ලදී.

2019 ජනවාරි මාසය සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| අත්පිට ගැනුම් | 70,000 |
| ප්‍රවාහන ගාස්තු | 30,000 |
| මහන මැෂින් මිලටගැනීම | 120,000 |
| ගෙවූ මාසික ගොඩනැගිලි කුලී | 10,000 |
| ගෙවූ මාසික විදුලි ගාස්තුව | 6000 |
| අත් පිට විකුණුම් | 140,000 |
| ණයට විකුණුම් | 80,000 |
| බැංකුවේ තැන්පත් කිරීම් | 50,000 |

මහන මැෂින් වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුයි 2019/01/31 දිනට ඉතිරි තොග නැත

(i). අ). "නීරෝගා මුඛ ආවරණ නිපැයුම්" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්දැයි නම්කර මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න

ආ). "නීරෝගා මුඛ ආවරණ නිපැයුම්" ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? ඔබේ පිළිතුරුට හේතු දක්වන්න

(ii). අ). චෙක්පත් මගින් ගණුදෙනු කිරීම සඳහා ආරම්භ කළ යුතු ගිණුම් වර්ගය නම් කර එම ගිණුම ආරම්භ කළ යුත්තේ කුමන බැංකුවක දැයි දක්වන්න.

ආ). "නීරෝගා මුඛ ආවරණ නිපැයුම්" ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් දක්වන්න

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

iii). නිෂ්පාදිත ජංගම රථ මගින් අලෙවි කිරීම අයත් වන සිල්ලර වෙළෙඳ ව්‍යාපාර වර්ගය කුමක්ද?

ආ). ඉහළ ප්‍රමිතියෙන් යුතුව මුඛ ආවරණ පාරිභෝගිකයන්ට සැපයීමට අපේක්ෂා කිරීම කුමන කළමණාකරන කාර්යයට අයත් වේද?

iv). ඉහත සිද්ධිය ඇසුරෙන් "නීරෝගා මුඛ ආවරණ නිපැයුම්" අලෙවිය වැඩි වීමට හේතු විය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න

v). මෙම ව්‍යාපාරය පිළියෙල කළ යුතු මූලික පොත් දෙකක් සඳහන් කරන්න

vi). 2019.01.01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියන්න

vii). අ). 2019.01.01 දින ලබාගත් බැංකු ණය මුදල් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් අගයයන් සහිතව ලියා දක්වන්න

ආ). 2019 ජනවාරි මාසයේ බැංකු ණය පොලිය හා මැෂින්වල ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න

viii). 2019.01.31 දිනට ව්‍යාපාරයෙහි මුදල් ශේෂය කොපමණද?

ix). අ). 2019.01.31 දිනෙන් අවසන් මාසයට ශුද්ධ ලාභය ගණනය කරන්න

ආ). 2019.01.31 දිනට හිමිකම ගණනය කරන්න

x). 2019.01.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් වල ධාරණ අගය කොපමණද?

I කොටස ව්‍යාපාර අධ්‍යනයේ
ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

**02.**
මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තක් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

i ) අ ) ව්‍යාපාර වල දැකිය හැකි අරමුණු දෙකක් ලියන්න.
ආ ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

ii ) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. මිනිස් අවශ්‍යතා අසීමිත වන අතර මිනිස් වුවමනාද සීමිත වේ.

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

ආ. යම් රටක රජය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ගයකි අයවැය ප්‍රතිපත්ති.

ඉ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත වන්නේ 2003 අංක 9 වේ.

ඊ. ඔපදමන ලද කළුගල් භූමිය නැමැති නිෂ්පාදන සාධකයට නිදසුනකි.

iii ) නගරයේ රෝහලක් ආසන්නයේ නැවුම් පලතුරු ඇසුරෙන් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස නැවුම් පලතුරු බීම අලෙවි සැලක් පවත්වාගෙන යන ආසිරි පලතුරු බීම ලට වැඩි ඉල්ලුමක් පවතින්නේ අනෙක් ව්‍යාපාර වලට වඩා සාධාරණ මිලකට අලෙවි කරන නිසා බව ආසිරි පවසයි.

අ. ආසිරිගේ පලතුරු බීම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් නම් කරන්න.
ආ. ඉහත (අ) සඳහා ඔබ සඳහන් කළ පාර්ශව ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීම හේතුවු කරුණු එක බැගින් ලියන්න.

iv ) "ව්‍යාපාර සංවිධාන විවිධ නිර්ණායක මත වර්ග කළ හැකය. එනම් අයිතිය , අරමුණ හා පරිමාණය අනුව වේ"

අ ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී භාවිතා කරන ප්‍රමාණාත්මක නිර්ණායක කවරේද?

ආ ) ඒක පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල දැකිය හැකි සමාන ලක්ෂණ කවරේද?

**03.**

i ) අ ) කළමනාකරණ යනු කුමක්ද?
ආ ) කළමනාකරණ කාර්යයක් ලෙස "පාලනය" යනුවෙන් කුමක් අදහස් වේද?

ii ) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. රාජ්‍යයේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රාජ්‍යය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

ආ. පුද්ගලයෙකු උපයාගත් ආදායමෙන් ඉතිරි කරගත් මුදලක් ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම ආයෝජනය නම් වේ.

ඉ. ව්‍යාපාර සැලසුම් කළ කටයුතු ඒ ආකාරයෙන්ම සිදු වී ඇත්දැයි සොයා බැලීම සැලසුම්කරණයයි.

ඊ. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනය ට ලැබෙන ප්‍රතිලාභය ලාභාංශය වේ.

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එළ කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

iii ) අ ) සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක දෙකක් නම් කරන්න.
ආ ) භාණ්ඩාගාර බිල්පත් අලෙවියේදී ප්‍රාථමික වෙළඳුන් වශයෙන් බහුලව කටයුතු කරන කුමන ආයතනය ද?

iv ) අ ) අලෙවි මිශ්‍රය ට අයත් විචල්‍යයන් කවරේද?
ආ ) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න?

**04.**

II කොටස ගිණුම්කරණය
ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න

i ) අ ) ගිණුම්කරණය අවශ්‍ය වන්නේ ඇයි?
ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක හිමිකම වෙනස් වන අවස්ථා දෙකක් ලියන්න.

ii ) පහත සඳහන් ගනුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

අ ) ව්‍යාපාරයේ අයිතිකරු වන සමන් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු 25000 ක් ව්‍යාපාරයෙන් ගැනීම.
ආ ) සි / ස ගුරු ගෙදර සමාගමෙන් රු 100000 ක් වටිනා පරිගණකයක් ණයට ගැනීම.

iii ) ඉසුරුගේ ව්‍යාපාරයේ ගනුදෙනු 4ක් ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

| දිනය | ගනුදෙනුව | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| 2019/01/10 | 1 | යන්ත්‍ර + 40000<br>මුදල් - 40000 | | |
| 2019/01/15 | 2 | බඩු තොගය + 30000 | | ණයහිමි + 30000 |
| 2019/01/20 | 3 | බඩු තොගය -25000<br>ණයගැතියෝ + 27000 | ලාභය + 2000 | |
| 2019/01/25 | 4 | මුදල් - 27000 | ලදවට්ටම් + 3000 | ණය හිමියෝ - 30000 |

●තවද ඉසුරු ගේ ව්‍යාපාරයේ 2019/01/01 මුළු වත්කම් 300000 ක් වු අතර මුළු වගකීම් 80000 විය.

අවශ්‍ය වන්නේ

අ ) ඉහත සඳහන් 1,2,3,4 ගනුදෙනු වටිනාකම් සහිතව දැක්වීමට.
ආ ) ඉහත ගනුදෙනු සටහන් කිරීමෙන් පසු 2019/01/25 දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව දැක්වීමට.

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

iv ) ගයනිගේ ව්‍යාපාරයේ 2019 පෙබරවාරි මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉ.අ | ගැනුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| 2/5 | 60 | අමල් | 5000 |
| 2/6 | 70 | කමල් | 2000 |

අවශ්‍ය වන්නේ

අ. 2019 පෙබරවාරි මාසය සඳහා විකුණුම් ජර්නලය පිළියෙල කරන්න.
ආ. අදාල ලෙජර ගිණුම් පිලියෙල කිරීම.

**05.**

i ) අ ) බොල්ණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
ආ ) බොල්ණය සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න?

ii ) එක්සත් ක්‍රීඩා සමාජයේ සිටි සාමාජිකයන් සංඛ්‍යාව දෙසීයක් වන අතර එක් අයෙකුගෙන් මාසික සාමාජික ගාස්තුව රු 20 කි. 2019 වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 1/1 ශේෂය | 24000 | උපකරණ ගෙනුම් | 16000 |
| සාමාජික මුදල් | 14000 | ක්‍රීඩා භූමිය නඩත්තු වියදම් | 6000 |
| | | ක්‍රීඩා උපදේශක ගාස්තු | 10000 |
| | | ප / ගෙ ශේෂය | 6000 |
| | 38000 | | 38000 |
| ඉ / ගෙ ශේෂය | 6000 | | |

**අවශ්‍ය වන්නේ,**

- 2019-12-31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා එක්සත් ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය

කවීන්ගෙ ව්‍යාපාරයේ 2019-12-31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ .

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

| | | |
|---|---|---|
| විකුණුම් | | 428000 |
| ආරම්භක තොගය | 16000 | |
| ගැනුම් | 210000 | |
| ගෙන ඒමේ කුලී | 8000 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 400000 | |
| ලී බඩු උපකරණ (පිරිවැය) | 60000 | |
| ලී බඩු උපකරණ ක්ෂය වෙන්කිරීම | | 12000 |
| ණයගැතියෝ | 26000 | |
| ණය හිමියෝ | | 33000 |
| දුන් වට්ටම් | 3000 | |
| ලද වට්ටම් | | 7000 |
| බොල් ණය | 4000 | |
| ගැනිලි | 9000 | |
| 12% බැංකු ණය | | 100000 |
| විදුලි ගාස්තු | 22000 | |
| වෙළෙඳ සේවක වේතන | 54000 | |
| වරිපනම් ගාස්තු | 2000 | |
| මුදල් ශේෂය | 16000 | |
| ප්‍රාග්ධනය | | 250000 |
| | 830000 | 830000 |

අතිරේක තොරතුරු

01. අවසන් තොගය 14000 කට තක්සේරු කර ඇත.

02. ලී බඩු උපකරණ පිරිවැය මත 10% ක්ෂය කරන්න.

03. ණයගැතියන්ගෙන් 3000 ක් බොල් ණය ලෙස කපා ගැනීමට තීරණය කර ඇත.

ශහේන්ගේ ව්‍යාපාරයේ 2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

ශහේන්ගේ ව්‍යාපාරයේ 2019-12-31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශනය

Learn TV

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.